# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2326/51 - 2023 අප්‍රේල් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2023.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය - RAT/LAN/10/FI/07.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවේ අංක 546 B, විහාර ග්‍රාම නිල වසමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක 521003/09/46/1 හා 2022/10/05 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 207 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0275ක් වූ ඉඩම් කැබැල්ල :

**01. කැබලි අංක 207**

ඉඩමේ නම: බුළුගහ වත්ත, වරිපනම් අංක 129/8, රජමාවත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සත්කොරලගේ නන්ද දිසානායක සහ සත්කොරලගේ සරත් දිසානායක; ප්‍රමාණය: හෙක්. 0.0275.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 ජුනි මස 15 වැනි දින පෙ.ව. 10.30 ට රත්මලාන, ගාලු පාරේ අංක 175 දරන ස්ථානයේ පිහිටි ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2023 ජුනි මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල් හා ඒ මුදල් ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. ඔප්පු හා අනෙකුත් ලේඛන පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

එච්. ආර්. හිමාලි කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම් ,
රත්මලාන.

2023 අප්‍රේල් මස 01 වැනි දින,
රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04-0067

1A - G 039308 – 19 (2023/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*